# OPERATIONS MANAGEMENT (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## මෙහෙයුම් කටයුතු

නිෂ්පාදන ක්‍රියාවලිය තුළ යෙදවුම් (සම්පත්) නිමවුම් (භාණ්ඩ හෝ සේවා හෝ) බවට පරිවර්තනය කිරීමට අදාළ ව සිදු කරන සියලු කටයුතු මෙහෙයුම් කටයුතු ලෙස හඳු

## මෙහෙයුම් කටයුතු සිදුවන ව්‍යාපාර

1. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර
2. සේවා නිෂ්පාදන ව්‍යාපාර

ClassWork.LK

## භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර

භාණ්ඩ නිප්පාදන ව්‍යාපාරවල මූලික වශයෙන් නිෂ්පාදනය කරනු ලබන ස්පෘශ්‍ය භාණ්ඩ (Tangible goods) ය.

**නිදසුන් :**

පාවහන්, කිරිපිටි, සිසිල් බීම

## සේවා නිෂ්පාදන ව්‍යාපාර

සේවා නිෂ්පාදන ව්‍යාපාරවල නිෂ්පාදනය කරනු ලබන්නේ අස්පෘශ්‍ය භාණ්ඩ (Intangible goods) ය.

**නිදසුන් :**

වෛද්‍ය සේවා, ප්‍රවාහණ සේවා, රක්ෂණ සේවා

ClassWork.LK

## මෙහෙයුම් කළමනාකරණය

සංවිධානයක අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා මෙහෙයුම් කටයුතු, සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම හා පාලනයට අදාළ කළමනාකරණ කටයුතු සමූහය මෙහෙයුම් කළමනාකරණයට අයත් වේ.

## මෙහෙයුම් කළමනාකරණයේ කාර්යයන්

මෙහෙයුම් කළමනාකරණය, නිෂ්පාදන ඉංජිනේරුකරණය, නිෂ්පාදන සැලසුම්කරණය, ද්‍රව්‍ය මිල දී ගැනීම, නිෂ්පාදන පාලනය, පර්යේෂණ හා සංවර්ධන යන ක්‍රියාකාරකම් මෙහෙයවීම හා නියාමනය කිරීම අන්තර්ගත සංකීර්ණ කළමනාකරණ ක්‍රියාදාමයක් ලෙස හැඳින්විය හැකි ය.

ClassWork.LK

# මෙහෙයුම් කළමනාකරණයේ මූලික කාර්යය

ආයතනයක අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා මෙහෙයුම් කළමනාකරණය දායකවන අතර, සම්පත් (යෙදවුම්) උපයෝගී කරගෙන ඉහළ ගුණාත්වයෙන් යුත් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම මෙහෙයුම් කළමනාකරණයේ මූලික කාර්යය වේ.

ClassWork.LK

# මෙහෙයුම් කළමනාකරණයේ වැදගත්කම

- ඉහළ ගුණාත්වයකින් යුත් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කළ හැකි වීම.

- මෙහෙයුම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව හා සඵලදායීතාව වැඩි කර ගත හැකි වීම.

- නිෂ්පාදන පිරිවැය අවම කර ගත හැකි වීම හා ලාභය වැඩි කර ගත හැකි වීම.

- ගෝලීය ව්‍යාපාර පරිසරය තුළ තරගකාරිත්වයට සාර්ථක ව මුහුණ දීමට හැකි වීම.

ClassWork.LK

- නව්‍යතාවෙන් යුක්ත ව භාණ්ඩ හා සේවා හඳුන්වා දිය හැකි වීම.

- සමාජ වගකීම් නිසි ලෙස ඉටු කිරීමෙන් ව්‍යාපාරයේ වර්ධනයට මෙන්ම රටේ තිරසර සංවර්ධනයට ද දායකත්වයක් ලබා දීමට හැකි වීම.

ClassWork.LK

# පරිවර්තන ක්‍රියාවලිය

යෙදවුම් නිමැවුම් බවට පත් කිරීමේ ක්‍රියාවලිය පරිවර්තන ක්‍රියාවලිය ලෙස හැඳින්වෙන අතර එය පහත දැක්වෙන සටහනින් දැක්විය හැකි ය.

| යෙදවුම් | → | පරිවර්තන ක්‍රියාවලිය | → | නිමැවුම |
|---|---|---|---|---|
| භූමිය<br>ශ්‍රමය<br>ප්‍රාග්ධනය<br>ව්‍යවසායකත්වය | → | නිෂ්පාදන ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම.<br>නිෂ්පාදන ක්‍රම තීරණය කිරීම.<br>අවශ්‍ය ප්‍රමාණයට සම්පත් යෙදවීම.<br>තාක්ෂණික දැනුම යොදා ගැනීම. | → | නිෂ්පාදිත (භාණ්ඩ හා සේවා) |

ClassWork.LK

# එකතු කළ අගය

පරිවර්තන ක්‍රියාවලියේ විවිධ අවස්ථාවල දී යෙදවුම්වලට වටිනාකමක් එකතු වීමෙන් නිෂ්පාදිතයේ වටිනාකම වැඩි වන අතර එය එකතු කළ අගය ලෙස හඳුන්වයි.

**නිදසුන් :**

ඇඟලුම් නිෂ්පාදනයේ දී රෙදි කැපීම, මැසීම, මැදීම, ඇසිරීම යන අවස්ථා පසුකර ඇඟලුම් බවට පත් කළ පසු එහි අගය යෙදවුම්වල අගයට වඩා වටිනාකමක් ගනී.

ClassWork.LK

# මෙහෙයුම් කළමනාකරණයට අයත් කාර්යන්

මෙහෙයුම් කළමනාකරණයට අයත් කාර්ය පහත පරිදි දැක්විය හැකි ය.

- නිෂ්පාදන ඉංජිනේරුකරණය - Production Engineering
- නිෂ්පාදන සැලසුම්කරණය - Prodcution Planning
- ද්‍රව්‍ය මිල දී ගැනීම - Purchasing
- නිෂ්පාදන පාලනය - Prodcution Controling
- පර්යේෂණ හා සංවර්ධනය - Research and Development

Class Work LK

# නිෂ්පාදන ඉංජිනේරුකරණය

නිෂ්පාදන ක්‍රියාවලිය, අවශ්‍ය යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, නිෂ්පාදන කාලසටහන, අවශ්‍ය ද්‍රව්‍ය, අවශ්‍ය ද්‍රව්‍යවල පමාණය හා ගුණාත්වය ආදිය තීරණය කිරීම, නිෂ්පාදන ඉංජිනේරුකරණය වේ.

ClassWork.LK

# නිෂ්පාදන සැලසුම්කරණය

කිසියම් නිෂ්පාදන ආයතනයක නිශ්චිත අනාගත කාලපරිච්ඡේදයක් තුළ කුමන භාණ්ඩ හා සේවා කෙසේ නිෂ්පාදිනය කළ යුතු ද, කොපමණ නිෂ්පාදනය කළ යුතු ද, කවර දිනක නිෂ්පාදනය කළ යුතු ද යන්න පිළිබඳව පුලුල්ව කරනු ලබන කටයුතු නිෂ්පාදන සැලසුම්කරණය වේ.

## නිෂ්පාදන සැලසුම්

නිෂ්පාදන සැලසුම්කරණය මගින් බිහිකෙරෙන වර්තමානයේ හිතාමතා සකස් කරනු ලබන වැඩපිළිවෙල නිෂ්පාදන සැලසුම් ලෙස හැඳින්වේ.

නිෂ්පාදන සැලසුම් වර්ග 2 කි.

1. කෙටි කාලීන නිෂ්පාදන සැලසුම්
2. දිගු කාලීන නිෂ්පාදන සැලසුම්

ClassWork.LK

## ද්‍රව්‍ය මිල දී ගැනීම

නියමිත ද්‍රව්‍ය අවශ්‍ය ප්‍රමාණයෙන්, අවශ්‍ය අවස්ථාවේ දී, අවම පිරිවැයකින් යුතු ව සපයා ගැනීම ද්‍රව්‍ය මිල දී ගැනීම යි.

## නිෂ්පාදන පාලනය

නිෂ්පාදන ඉංජිනේරුකරණය සහ නිෂ්පාදන සැලසුම්කරණය අනුව ස්ථාපිත කොට ඇති ඉලක්ක ළඟා කර ගන්නේ ද, යන්න සොයා බැලීම හා එසේ නොවන විට ඒ සඳහා අවශ්‍ය ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග තීරණය කිරීම නිෂ්පාදන පාලනය යටතේ සිදු වේ.

ClassWork.LK

## නිෂ්පාදන පාලනයට අයත් දෑ

- යාන්ත්‍රික පාලනය
- තොග පාලනය
- තත්ත්ව පාලනය
- පිරිවැය පාලනය

## පර්යේෂණ හා සංවර්ධනය

පවත්නා නිෂ්පාදිතය පිළිබඳ වත්, නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ වත් නව නිෂ්පාදන සැලසුම් පිළිබඳ වත් තොරතුරු ඒකරාශි කිරීම හා ඒවා වැඩි දියුණු කිරීම පර්යේෂණ හා සංවර්ධනය ලෙස හැඳින්වේ.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura